# නිර්මාණ Nirmana

## කම්මැලිකම

මෝහයට මුවාවී හොරෙන් ඉහිබිහි පාලා
මුලාකරගත් සිතෙහි දුබල තැන් හොඳින් දැන
ළං ළංව සෙනෙහසින් කියයි ඔවදන් මෙලෙස

හයේ කනිසම වැදී ඇහැ අරින්නට පෙරම
පාන්දර වැඩීඩී තව මක්කරන්නද පිබිද
උණුසුමට ගුලිවෙලා තව ටිකක් සැතපෙන්න

දවස මැද යන්තමට යම් වැඩක් කරන විට
කාලගුණේ නරක නොවැ මදැයි ඔය වැඩ කළා
හෙටත් දවසක් නොවෙද? ගත වෙහෙස නිවන්නට
පැන් ටික තොලගගා උණුසුමක් ලබනු දැන්

ගෙවන විට මැදි වයස පසුතැවිල්ලෙන් බරව
පරාජිත මුව මඩල මොකද ඔය දුක් බරව
මෙයි දැන් කළ යුත්තෙ පරාජන් ගැලවෙන්න
පලායනු ජීවිතෙන් අණකරයි අධම ලෙස

♦ **ප්‍රදීපා වික්‍රමසිංහ** London SW19

## පාපෝච්චාරණය

විසල් මැදුරු තව අත මිට යහමින් තිබුණට
කිරුළු පලන් රජෙක් වගේ අද මං උන්නට
දරන්න බැරි දුකින් ආවෙ බුදු ගේ ගාවට
සමාවෙන්න තාත්තෙ මේ පව් කළ පුතු හට

පුංචි පුතා ලොකු මිනිහෙක් කරන්න සිතු නුඹ
උදේ හවා පස් කෙටුවේ මහන්සි නොබලම
පොතට විභාගෙට මගෙ හිත යටවුණ හන්දම
ගත දාඩිය අත කරගැට දැක්කෙම නෑ මම

තට්ටු දෙකේ හැඩට විසල් නිවස තනන්නට
උපන් ගෙදර කඩල අළුත් ගෙපළ දැම්මෙ මම
මැටි අනලා ගේ හැදූ හැටි අම්මා කිව්වම
තාත්තෙ නුඹේ ඇසේ කඳුළු පෙනුණෙ අදයි මට

දුකක් නොදී ඇහැක් වගේ මා දැඩි කෙරුවට
දිවිය පුරා නුඹ දැක්කේ හීන පමණමද
කාගෙ දෙපා මං වඳින්නෙ නුඹ සුරලොව අද
සමාවෙන්න! තාත්තෙ මේ පව්කළ පුතු හට

♦ **ශ්‍රියා කුමාරසිංහ**
Dunedin - New Zealand

## අනුරාගිනී

අන්ද අඳුර බිඳ පායන
චන්ද්‍ර මඩල නැති අහසට
මන්ද එළිය ගෙන පැයූ
පහන්තරුව නුඹ පෙරදිග

බැන්ද පවුරු පදනම් බිඳ
නින්දා ගැරහුම් විඳ විඳ
මන්ද අවුලුවා ගිනිදැල්
පලාගියේ අවර ගිරට

නින්ද පැහැරගත් තුන්යම
සෝ ලතැවුල් ඒ නැගනැග
කිම්ද කාරණා නොදනිම්
ප්‍රේමය කටුකද මෙතරම්!

වින්ද රසින් ගත සැලි සැලි
රහසින් ඇවිලෙයි රාගිනි
කිම්ද කාරණා නොදනිම්
රහසින් ඇවිලෙයි රාගිනි

♦ **ඒ. එම්. විජේසිංහ**
Sri Lanka



ගණිත පාඩම

කනෙන් ඇද බඩතුරෙන් මිරිකා
වේවැලෙන් කෝටුවෙන් බැටකා
ගණන් බැරිවී පන්තියේ
රැඳී අන්තිම පේලියේ
දිගින් දිගටම පේල් වෙනකොට
එපා වී ඉස්කෝලෙ යැමත්
නැවතුණත් වඩු බංකුවේ


ගුරුන් පාඩම් කියා දෙන විට
තේරුණාදැයි ඇසූ සැණකින්
හිස සැලූ මට හිනා වූ
ඔච්චමට සරදමට වාගේ
එකට සිටි ඇය ගිහින් ඉහළට
සේවයට මහ බැංකුවේ

සොයාවිත් අද පැරණි මිතුදම්
මතක්කර දෙයි
තමන් අලුතින් හදන නිවසක
වැඩේ හරියට තිතට නූලට
කරවගන්නට

වහළයේ දිග පළල අරගෙන
ජනෙල් උළුවහු
ටිකත් මැනගෙන
වඩු රියන් අඩිවලට පෙරළා
අඩිත් මීටර් වලට හරවා
පහසුවට ලාබයට අඩුවට
එදා බැරිවුණ ගණන් හරියට
හදා දෙන්නැයි කියයි අද මට

♦ **චන්ද්‍රසිරි මීවනගේ** Sri Lanka

## ඇය ඔහුට ලියූ කවි - 6
## Poetry she wrote to him - 6



නුග සෙවනක්ය නුඹ මගෙ සරතැස නිවන
නෙත රසඳුනකි නුඹ අතකුරු මන බඳින
මඳ පවනක්ය නුඹෙ හඬ ගුවනින් ගෙනෙන
විගසින් එනු මැනවි පොද වැස්සක් රැගෙන

ලා සඳ කිරණ වී සොමි ගුණ විඳ ගන්න
සීතල සුළං රැල්ලක් වී දැව ටෙන්න
ඉමිහිරි කුරුළු රස ගී පද මුමු ණන්න
සිහිනෙන් ඇවිත් මා හදවත සන සන්න

දිදුලන තරු කැටකි පරයන නුඹෙ නයන
සිහිලැති මඳ නලකි මගෙ වුවනත සිඹින
රත් පැහැ දෙතොල් පොපියන විට මඳ හසින
දෙකොපුල් සිඹින්නෙමි නුඹෙ තුරුළට පැමිණ

නුඹ සුන්දරයි සඳමල පිබිදුණ රෑට
ඒ සඳ මඬල සුවඳයි කොඳ පිපි දාට
ආදර මල් පිපෙන පුදින හදව තට
නුඹ සුන්දරයි මගෙ හිත ළඟ හැම දාට

කෝපි මල් සිනා පිරි මුව දකින් නට
ඒ මල් සුවඳ මා වෙතටම හමන් නට
දෙගොඩතලා යන සෙනෙහස පුදන් නට
බලා හිඳිමි එනතුරු මගෙ කැදැල් ලට

(**අඥාතයි**) **Anon - x x x**

## වෙදැදුරාණෙනි !

හරිතකී මලක් සේ රෝ බියට සුවය දෙන
දිගහැරෙන සියපතක විසුල ඔසු බිඳුව මෙන
අහස්කුස පොලෝතල යා කරන මහ රැඳුණ
මහඟු සවියක්ය ඔබ ජීවිතය මත රැඳුණ

තියුණු දෙනෙතින් බලා ඔවදනක් යළි දෙන්න
තිත්ත රස කසායට අමා බිඳුවක් ලන්න
දුක් ගැහැට ඉවසමින් මෙමග නොහැරම ඉන්න
ගුරු පියාණෙනි වරක් වත් යළිත් මෙහි එන්න!

♦ **එරංග කන්කානන්ගේ**
Sri Lanka

## චිරං ජයතු නා සමිඳුනි !

සයුර වෙත යන ගඟ පරිද්දෙන්
සිල්ප නොමසුරු ලෙස බෙදූයේ
නොමැතියෙන් ගුරු මුෂ්ටි රකිනට
ගෝලයින් දරුවන් හැදූයේ

තරිඳු ඔබ විය අපේ ලොව තුළ
ශිල්ප ලබනා අවධියේදී
නිම්වළලු සපුරා පුරා හඳ
සමිඳු පණ්ඩිත තවම අපහට

ටොකුවලින් ඔලු කට්ට තැළුණා
දීපු වැඩ ටික වැරදි හන්දා
නොමැතියෙන් වනපොත් කළෝ
සිටියෝය පන්තියෙන් එළියේ

සමහරක් දා නිදාගත්තේ
හෙට දවස ගැන බයේ ගැහි ගැහි
මනසා වෙ පසන්නේන
භාසතීවා කරෝතිවා
මොනරිඳු එකල්හි පුල් සලග නවාගනී
සිදත් සහරා පන්නරය අප
ලැබූයේ ඔබ නිසයි සමිඳුනි!
හදාරා නිවැරදිව වියරණ
ලදිමි විවරණ රෙදෙව්වම වෙත
කරද්දී නිවැරදිව කථනය
එදා මෙන් අද සමිඳු සිහිවේ

මෙ පින්බලයම ඇතිය සමිඳුනි
සියක් වස් කල් වැඩසිටින්නට
නිදුක් නීරෝගී සුවෙන්!
චිරං ජයතු පල්ලත්තර නා සමිඳේ !

♦ **අමර ගුණසේකර**
Paris - France

## වසන්තය

කොළ සුන් ගස් මුදුන්
පලා පැහැයෙන් බැබළී
හිරු එළියෙන් ඔකඳ වී
නව දිවියකට පා තබන
තරුණ තරුණියන් විලස
පැහැබර අනාගතයක්
මවන්නා සේය ලොව

වැසී තිබු ගන අඳුර
ගත තවන ශීතලය
වසා ගෙන නැගී එන
රන්වන්වූ හිරු කිරණ
යොවුන් මල්බර කුමරියක
විලසින් හමා යයි දස අත

මහ පොළව පලා ගෙන
පස තුළ නිදන් ගත වූ
අල මුල් මොටෙයියන්
හෙමි හෙමින් හිස නගා
පස තුළින් මතු වෙවී
සොබා දහමේ අරුම
හෙළි කරයි මුලු ලොවට

කුරුලු මැසි කොබෙයියන්
යුහු යුහුව කඩිනමින්
නිවෙස් කර පිළිසකර
අර අඳියි අනාගත
පරපුරක මතු දිනට
වසන්තය පැමිණ ඇති
බව කියා ලෝකයට

♦ **මධුරි අබේවික්‍රම**
Harrow UK

## දරු සෙනෙහස

ගෙරවුම් රැවුම් පිප්පුම් දහසක් බාදා
දුක් කම්කටොළු විඳ වේතනයක් පාදා
නිවසින් නැගෙන අඩු ලුහුඬුත් නිති සාදා
දරු සෙනෙහසින් හැම දුක් සැපයක් වූදා

පුරට අවට බිහිවුනෙ නොම සොයාලා
කිරට හඬන පුත ඔබෙ මුව බලාලා
දරට ගියෙද පලවැල මලු පුරාලා
බරට කිරි එරෙව්වෙමි ළැම පුරාලා

උදයට ගොසින් වේතනයක සිත බන්දා
සවසට නිවස එයි අහරින් මලු රන්දා
දූ දරුවනගෙ දියුණුව හද දුක සින්දා
බැරිවුණු දාට නැති දරු කුමටද මන්දා

දුව හොඳ මොකද රුව අනිසිව යොදා නම්
පුත හොඳ මොකද සබයට කට නොදා නම්
වැඩු මව්පියන් ගැන අණගුණ දැනේ නම්
දුව පුත කියා බැඳි සෙනෙහස නොවේ නිම්

වියතුන් සබා මැද මහ වියතෙකු වෙන් නයි
ගුණයෙන් පරන්හට යහගුණ පෙන්වන් නයි
නිලයෙන් දනෙන් ඉහළම තැන ලැබ ගන් නයි
දෙගුරුන් පැතුම දුව පුත මේ ලෙස වෙන් නයි

ලොවින් එකෙක් එක දෙයකට වෙයි සමත
රුවින් මුවින් දුව පුත හදතොත් සැපත
නිවන් ලබන තුරු මව්පියො පැතු පවත
දුවත් පුතත් පෑ ගති යහපත දියත

♦ **හෙන්රි කුමාරප්පෙරුම**
Sydney Australia

**කවියට කලාවට අත හිත දෙන ලෙසට**
**මේ කවි පිටුව වෙන්වෙයි පාඨක ඔබට**
**සිතුවිලි ගොතා රසකවි ලියමින් හැඩට**
**අප වෙත එවනු මැන කාටත් කිය වන්ට**



## ඔබ නැති වෑකන්ද එළිය නැත !

ඉර වර වර ඉර ගිරවුන් කොයි අම්මේ
සඳ වර වර සඳ සාවුන් කොයි අම්මේ
හඳුන්පතේ හී ගඩු පිපුණයි අම්මේ
සීපද කියන්නෙමි ඉඳගෙන වැව් බැම්මේ

මන්දාරමට පිල් විදහන රණ මොණරු
රන් දේදුන්න දිග හැරියයි වැව් කුමරු
වාන් දොරටු අරවා පෙම් බස් කෙඳිරු
වලිකුකුළනි වරෝ! හේඩාවෙන් අඳුරු

වැවට එළිය වැව් මැද නිල් දිය වරය
නිල් මල් බිසෝ මැණිකෙගෙ මල් පෙළ හරය
යල මහ දෙකන්නෙම දෙන්නට වී මුරය
කෙත් ඇළ දිගේ බිස්සට යයි අඩ හැරය

වන්නම් තාල අල්ලා දිය කෙළීම ට
මස්ටකයන්ට මල් ඇත මුතු කුඩේක ට
දිය කා සකුණ රොද දිය මස් සෙවීම ට
කිම්දෙති වැවෙහි නැවිත් රළ පනාව ට

දියමංකඩට කුරගෑ මළ හිරුගෙ රත
වැතිරී කුඹුක් දරණේ මුල් දරණු මත
සඳ දියවරට ඉණිමං බැඳ මැකෙනු ඇත
ඔබ නාවොතින් වෑ කන්දද එළිය නැත!

**පුලියන්කඩවර - ජේ. ජේ. වික්‍රමසේන**

## තිරය වැසී යයි

බටහිර අහසේ
හිරු සැඟවී යන විරාමයේ
අනිමිස ලෝචන පූජාවෙන්
ඔබ ඇත බලා ඉන්නේ
ගිලන් ඇඳේ
මරණ මංචකයේ

විඩාපත් නැසියන් ඔබ වටා
කොඳුරණ බව
නො ඇසේද?
රෑහි හඬන හඬ

අඩ අඳුර විනිවිද
අඩවන්වූ දෙනෙතට
දිස්වන්නේ
අතීතයද
නැත්නම්
හෙට ඔබ පිවිසෙන
එහා ලෝකයද?

කෙසඟ සිරුරෙන්
උණුසුම ඉවතට ගලා යයි
බල සිඳුණු අත් පා
හිස් තැනකි ඔබ මුහුණ
මරණයේ ද්වාරය අබියස

♦ **මෛත්‍රී පනාගොඩ**
Sydney Australia

## එක් කාන්තිමත් දවසක සුළඟ....

සුළඟ,
එක් කාන්තිමත් දවසක
පිච්ච මල් සුවඳක් සමඟින්
මගේ ආත්මයට කතාකෙරුවේය.

මගේ පිච්චමල් සුවඳ වෙනුවට
නුඹේ උයනේ රෝසමල් වල
සියළුම සුවඳට මම කැමැත්තෙමි.

මා ළඟ රෝසමල් නැත!
මඋයනේ සියළුම මල්
පරවී ගොස්ය.
එසේනම්,
මිලින මල් පෙති ද
කහපැහැ පත්‍රයන් ද
උල්පතේ සියළුම ජලය ද
මම රැගෙන යමි.

සුළඟ පිටවුණි.
හඬා වැලපුණු මා
මාගෙන්ම මෙසේ ඇසුවෙමි.
නුඹට පවරා දුන් උයනට
නුඹ කුමක් කෙරුවෙහි ද?

(ස්පාඤ්ඤ ජාතික කවියෙකු
වන අන්තෝනියෝ මචාදෝ
**Antonio Machado** ගේ
The Wind One Brilliant Day
නම් කවියේ පරිවර්තනය)

♦ **එරංගා පෙරේරා**
Netherlands නෙදර්ලන්තය

## අහෝ ! අපේ ගම !

පන්කොළ පැදුර පන්මලු වේවැල් කුරුණී
සිංහල ගෙදර අටුකොටු පැස බිසි බරණී
පන්සල දෙවොල පොලිතීන් යායෙන් පිරිණී
ගම්බද සිරිය කෝ අද රමණීය පැරණී

වැටකේ යාය වනසා ගිනි තබා ඇත
රථගාලක් ය පෙර දා බත වැවූ කෙත
කුරහන් ගලෙන් ගල් පඩියක් තනා ඇත
කිසි සේවයක් වංගෙඩියෙන් වෙලා නැත

අඹ දඹ පේර ගස් පෝලිම දෙවැට දිගේ
විදුලිය රැහැන් ඇදුමට බිම හෙලන රගේ
ඇල දොළ වසා මං මාවත් හදන යුගේ
මහ අපලයකි හෙට උපදින පුතුට මගේ

විය ගස් නගුල් දරමඩුවෙහි ගොඩ ගහලා
හරකා බාන සායිබු නානට යවලා
කරුවල බුරුත ගස් ලීමෝලට ඇදලා
බල මැන ! විදු යුගේ දියුණුව ඇස් ඇරලා

♦ **පී. බී. හිද්දමුල්ල - මිගලෑව**